මාධ්‍ය මගින් සමාජයේ යම් යම් අයවලුන් හැඳින්වීම සඳහා භාවිතා කරනා භාෂාව ඔස්සේ, ඔවුන්ව සමාජයෙන් කොන් වීම සහ වෙනත් අගතීන්ට පත් වීමේ ඉඩක් තිබෙන්නේ නම්, එම භාෂාව කෙතරම් යෝග්‍යද යන්න නැවත සිතාබැලීම අවශ්‍ය වේ.

මීට උදාහරණ ලෙස, මත්ද්‍රව්‍ය භාවිතා කරන්නන් හැඳින්වීම සඳහා බොහෝ විට පුවත් වාර්තාවන් තුළ භාවිතා වන "කුඩ්ඩා", "මත්ලෝලියා" වැනි යෙදුම් දැක්විය හැක. කුඩ්ඩා යන යෙදුම හා බැඳී ඇති ගර්හාත්මක සහ නිෂේධනාත්මක අර්ථය සමගින්, මත්ද්‍රව්‍ය ඇබ්බැහියකින් යුක්ත වූ අයෙකුට පුනරුත්ථාපනය ඔස්සේ හෝ නැවත සමාජයට ඇතුළත් වීමට ඇති ඉඩ ඇවිරීමක් සිදු විය හැක. එසේම එය පුද්ගල ගරුත්වයට පවා හානිදායක වනු ඇත. එසේම මත්ද්‍රව්‍ය ඇබ්බැහියක් යනු සංකීර්ණ කරුණු සමුදායක් විනා, සරල මත්ද්‍රව්‍ය සඳහා ලොල් වීමක් නොවන බැවින්, 'මත්ලෝලියා' වැනි යෙදුම් ගැටළුකාරී වේ.
එනිසා මෙවැනි යෙදුම් ශිෂ්ට සම්පන්න චින්තයනක් දියුණු කිරීම සඳහ කෙතරම් යෝග්‍ය වන්නේදැයි මාධ්‍ය විසින් වරක් දෙවරක් නොව තෙවරක් සිතාබැලීම වටී.
#MediaEthicsSL #lka #SinhalaPress #Divaina #Aruna